**ශීර්ෂය 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 දෙසැම්බර් 31 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,964.25 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1,919.16 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 45.09 ක් හෙවත් සියයට 2.29 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 1,628.35 | 1,597.81 | 30.54 | 1.88 |
| මූලධන | 335.90 | 321.35 | 14.65 | 4.33 |
| **එකතුව** | **1,964.25** | **1,919.16** | **45.09** | **2.29** |

**2.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 21501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 60.32 | 53.09 | 56.32 | 66.27 | 200.00 | 108.91 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වූ තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 32.81 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0081/000 | 0.40 |
| 6000/0000/00/0016/0058/000 | 14.27 |
| 6000/0000/00/0018/0020/000 | 18.14 |
| **එකතුව** | **32.81** |

2.4 **විගණන නිරීක්ෂණය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| | ---------------- | ----------------- |
| (i) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (ii) | පරිගණක උපාංග පිළිබඳ ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | චංචල වත්කම් පිළිබඳ ලේඛනය | 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය |
| (iv) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 |

**3.2 විගණනයට සාක්ෂි නොවීම**

**--------------------------------**

පහත සඳහන් ලිපි ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(අ) විසර්ජන ගිණුමේ දක්වා තිබුණු 2015 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සතු වාහන 04 කට සිදු වී තිබුණු අනතුරුවලින් එකතුව රු.306,337 ක අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 1997 හා 2003 වර්ෂවල වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගේ එකතුව රු.232,070 ක්වූ ණය ශේෂ පරීක්ෂා කිරීමට අවශ්‍ය ණය ලිපිගොනු.

**3.3 විසර්ජන ගිණුම**

**-----------------**

**අයවැය විචලනය**

**------------------**

වැය විෂයයන් 39 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**---------------------------------------------------------------------**

විෂය අංක 21501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.109,051,233 ක් වූ අතර ඉන් රු. 6,929,021 ක් වූ හිඟහිටි ශේෂ වර්ෂ 1ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---

**විගණන හා කළමනාකරණ කමිටුව**

---

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමණාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

---

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) හෝමාගම කාර්මික විද්‍යාලයේ වාහන ඉසිලීමේ යන්ත්‍රයක් වසර 10 ක පමණ කාලයක සිට නිෂ්ක්‍රියව පැවැතුණි.

(ii) මන්නාරම කාර්මික විද්‍යාලයේ ත්‍රීරෝද රථ පාඨමාලාව සඳහා UNICEF ආධාර යටතේ ලැබී තිබුණු රු.442,380 ක් වටිනා ත්‍රිරෝද රථය 2014 ජනවාරි මාසයේ සිට නිෂ්ක්‍රීයව පැවැතුණි.

(iii) කාර්මික හා තාක්ෂණ විද්‍යාලවල නිල නිවාස 23 ක් භාවිතා නොකිරීම හෝ නිසි පරිදි අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් අබලන් තත්ත්වයේ පැවැතුණි.

(iv) මන්නාරම කාර්මික විද්‍යාලයේ පුස්තකාලය සඳහා 2014 හා 2015 වර්ෂවල රු.148,923ක් වටිනා පොත් මිලදී ගෙන තිබුණද, විද්‍යාලය විසින් පුස්තකාල කාර්ය මණ්ඩලයක් පත් නොකිරීම හා ඉඩ පහසුකම් නොතිබීම නිසා එම පොත් නිෂ්ක්‍රීයව පැවැතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---

2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වාදී තිබුණු ඌනතා, අතිරික්තතා, විනාශ කළ යුතු, අළුත්වැඩියා කළ යුතු හා විකිණිය යුතු භාණ්ඩ සම්බන්ධයෙන් 2016 ජුනි 30 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. 2014 වර්ෂයට අදාළව තාක්ෂණ හා කාර්මික විද්‍යාල 09 කට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් අනාවරණය වූ ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් 2016 ජුලි 30 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

---

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් වත්කම් බාහිර පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු අතර එම වත්කම් මුදාහැරි දිනයන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

| | වත්කම් වර්ගය | ප්‍රමාණය | වත්කම පිහිටි ස්ථානය | වත්කම් ලබාදී ඇති ආයතනය | වටිනාකම |
|---|---|---|---|---|---|
| | | | | | රු. |
| (i) | ඉඩම් | අක්කර 30 | කුලියාපිටිය කාර්මික විද්‍යාලය | විශ්ව විද්‍යාල විද්‍යායතනය | |
| | | අක්කර 08 | - එම - | යොවුන් සේනාංකය | |
| | | පර්චස් 110 | බෙලිඅත්ත කාර්මික විද්‍යාලය | ක්‍රීඩා අමාත්‍යාංශය | |
| | | පර්චස් 9.5 | කැගල්ල කාර්මික විද්‍යාලය | පුද්ගලයෙකු වෙත | |
| | | පර්චස් 6.5 | - එම - | පුද්ගලයෙක් (බලයෙන් පදිංචිවී ඇත) | 25,000,000 |
| | | අක්කර 10 | මොනරාගල කාර්මික විද්‍යාලය | ඌව වෙල්ලස්ස ජාතික ක්‍රීඩාංගනය | |
| | | අක්කර 05 | - එම - | යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය | |
| | | අක්කර 1.5 | - එම - | විවෘත විශ්ව විද්‍යාලය | |
| | | අක්කර 01 | - එම - | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | |
| (ii) | ගොඩනැගිලි | 04 | මහනුවර තාක්ෂණ විද්‍යාලය | මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ ආයතනය | 1,155,000 |

**(ඈ) වාහන පාලනය**

දෙපාර්තමේන්තුවේ වාහන ඇනිය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බෙලිඅත්ත කාර්මික විද්‍යාලයට අනුයුක්ත කර තිබුණු වාහනයක් 2011 මාර්තු 18 දින එන්ජිම අකර්මන්‍ය වීම හා 2011 ජුනි 05 දින එම විද්‍යාල පරිශ්‍රයේ වාහනය නවතා තිබියදී පසුපස වීදුරුව බිඳීම යන සිද්ධීන් දෙක හේතුවෙන් වාහනය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රු.1,973,825 ක් වැයකර තිබුණි. මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව 2014 ජුනි 25 දිනැති පරීක්ෂණ වාර්තාවට අනුව අලාභයෙන් සියයට 40 ක් වාහනයේ ආදාළ රියදුරුගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණි. එම මුදල 2016 ජුනි මාසය වන විටත් අදාළ රියදුරුගෙන් අය කර ගෙන නොතිබුණි. තවද මෙම අලාභය විසර්ජන ගිණුමේ අලාභහානි යටතේ සඳහන් කර නොතිබුණි.

(ii) 2012 සැප්තැම්බර් 27 දින අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලයේ අධ්‍යක්ෂවරයා විසින් දෙපාර්තමේන්තුවේ මෝටර් කෝච් වර්ගයේ වාහනයක් පදවාගෙන යන අවස්ථාවේදී අනතුරට ලක්වී තිබුණි. එම නිලධාරියා වෙත මෝටර් කොච් වර්ගයේ වාහන පැදවීම සඳහා වන රියදුරු බලපත්‍රයක් නොතිබුණි. මෙම වාහනය අළුත්වැඩියා කිරීම සඳහා රු.1,000,000 ක වියදම් ඇස්තමේන්තු කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව වාර්තාව 2013 ජනවාරි 11 දින ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාවට අනුව අලාභයෙන් සියයට 50 ක් වාහනය පැදවූ අධ්‍යක්ෂවරයාගෙන්

අයකර ගැනීමට තීරණය කර තිබුණි.ඒ සම්බනක්ධයෙන් අදාළ අධ්‍යක්ෂවරයා විසින් අභියාචනයක් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබුණි. එම අභියාචනය සලකා බලා අලාභයෙන් සියයට 50 ක ප්‍රමාණය එම නිලධාරියාගෙන් අය නොකරන ලෙස 2016 ජුලි 15 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව රු.1,000,000 ක සම්පූර්ණ අලාභය රජයට වැය බරක් වී තිබුණි.

(iii) දෙපාර්තමේන්තුව සතු වාහනයක එන්ජිම 2012 මාර්තු මාසයේ සිට ක්‍රියාවිරහිත වී තිබුණි. එම දෝෂය සිදු වී වර්ෂ 04 කට වැඩි කාලයක් ගතවී තිබුණත්, 2016 ජූනි 20 දින වන විටත් එම වාහනය යථා තත්ත්වයට පත් කිරීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(iv) කුරුණෑගල, ගාල්ල හා අම්පාර යන තාක්ෂණ විද්‍යාලවල රාජකාරි කටයුතු සඳහා වාහන 3 ක් අනුයුක්ත කර තිබුණි. එම විද්‍යාලවල නිල වාහන හිමි අධ්‍යක්ෂවරුන් තිදෙනාද ඉහත වාහන 3 ඔවුන්ගේ පෞද්ගලික හා රාජකාරි කටයුතු සඳහා ද යොදාගන්නා බව දෛනික ධාවන සටහන් පරික්ෂා කිරීමේදී අනාවරණය විය. කෙසේ වෙතත් සියළු ගමන් වියදම් සඳහා ඉන්ධන අදාළ විද්‍යාලය විසින් වැය කර තිබුණිත්, එම නිලධාරින් විසින් 2015 වර්ෂයේදී රු.95,340 ක් බැගින් ඉන්ධන දීමනාවද ලබා ගෙන තිබුණි.

(v) 2014 දෙසැම්බර් 01 දින අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මූල්‍ය) ගේ ලිපිය ප්‍රකාරව කුරුණෑගල තාක්ෂණ විද්‍යාලයේ වැඩ බලන අධ්‍යක්ෂවරයාට 2014 ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි මාසිකව ඉන්ධන ලීටර් 140 ක ප්‍රමාණයක් ගෙවීම අනුමත කර තිබුණි. ඒ අනුව හිඟ ඉන්ධන දීමනා වශයෙන් 2015 ජනවාරි 13 දින රු.191,637 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් එම කාල පරිච්ඡේදය තුළ දෙපාර්තමේන්තුවේ සිට නිවස දක්වා යාමට හා ඒමට යොදා ගෙන තිබුණු වාහනයට දෙපාර්තමේන්තුව විසින් ඉන්ධන සඳහා වියදම් කර තිබුණු බව වාහනයේ දෛනික ධාවන සටහන් පරික්ෂාවේදි නිරීක්ෂණය විය. අදාළ හිඟ ඉන්ධන දීමනා ගෙවීමේදි ඉහත සඳහන් ඉන්ධන වියදම් කිසිවක් අඩු කිරීමෙන් තොරව මුළු දීමනාවම ඉහත සඳහන් නිලධාරියාට ගෙවා තිබුණි.

(vi) දෛනික ධාවන සටහන් පරීක්ෂාවේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

- දෛනික ධාවන සටහන්වල ගමන් කළ නිලධාරියාගේ නම සඳහන් කර නොතිබුණි.
- වාහනය පාවිච්චි කළ නිලධාරියාගේ කෙටි අත්සන නොතිබුණි.
- වාහනවල මයිලෝ මීටරය අක්‍රියවී ඇති අවස්ථාවල වහාම අළුත්වැඩියා නොකර ධාවනයේ යොදා තිබුණි.

**(ඉ) රජයේ නිවාස පාලනය**

**-----------------------**

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව කාර්මික/තාක්ෂණ විද්‍යාල 29 ක රජයේ නිවාස 213 ක් දෙපාර්තමේන්තුව සතුව පැවතුණි. ඒ සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය ප්‍රකාරව රජයේ නිවාසවල බදු කාලය වර්ෂ 5 ක් වන අතර ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.2 වගන්තිය ප්‍රකාරව බදු කාලය ඉක්මවා පදිංචිව සිටින නිලධාරීන්ගෙන් දණ්ඩන කුලියක් අයකර ගත යුතුව තිබුණි. තාක්ෂණ/කාර්මික විද්‍යාල 09 ක නිලධාරීන් 18 දෙනෙකු බදු කාලය ඉක්මවා රජයේ නිවාසවල පදිංචි වී සිටියත් එසේ දණ්ඩන කුලී අයකර ගෙන

නොතිබුණි. එම නිලධාරීන් අතරින් වර්ෂ 10 ක් ඉක්මවා පදිංචි සිටි නිලධාරීන් 07 ක්ද, වර්ෂ 15 ක් ඉක්මවා නිලධාරීන් 02 ක්ද හා වර්ෂ 20 ක් ඉක්මවූ නිලධාරීන් දෙදෙනෙකුද විය. එම නිලධාරීන් රජයේ නිවාසවලින් ඉවත් කිරිමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගෙන නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුව සතු රජයේ නිවාස ගණන, පිහිටි ස්ථානය, රජයේ නිවාස වර්ගය, පදිංචි වී සිටින නිලධාරීන්ගේ විස්තර හා ගෙවන කුලී පිළිබඳ විස්තර සඳහන් ලේඛනයක් හා පොරොත්තු ලේඛනයක් ප්‍රධාන කාර්යාලයේ පවත්වා නොතිබීම හේතුවෙන් රජයේ නිවාසවල පාලනය දුර්වල තත්ත්වයක පැවතුණි.

(iii) රජයේ නිවාස සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයේ පවත්වා තිබුණු ලිපිගොණුවල රජයේ නිවාස ලබාගත් නිලධාරීන් හා දෙපාර්තමේන්තු ප්‍රධානියා අතර ගිවිසුම්වලට එළඹ නොතිබුණි. ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6.6 වගන්තිය ප්‍රකාර රජයේ නිවාසයක් ලැබුණු නිලධාරියෙකු තමා එම නිවාසයේ පදිංචියට එන දිනයද, ඉවත්ව යන විට එම දිනයද, දෙපාර්තුමේන්තු ප්‍රධානියාට හා නිවාස වෙන් කර දෙන නිලධාරියාට දැනුම් දිය යුතුව තිබුණත්, එම නිලධාරීන් විසින් එසේ කටයුතු කර නොතිබුණි.

(iv) ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6.8, 8.3 සහ 8.4 වගන්ති ප්‍රකාරව නිලධාරියෙකු අස් වී යන විට ඉන්වෙන්ට්‍රි ලේඛනය ප්‍රකාරව බඩු නිසි පරිදි භාර දිය යුතු වුවත්, බොහෝ රජයේ නිවාසවල ඉන්වෙන්ට්‍රි පරීක්ෂා කර බඩු භාර දුන් බවට හා නිසියාකාරව භාරගත් බවට සාක්ෂි අදාළ ලිපිගොනුවල නොතිබුණි.

(v) 2013 ඔක්තෝබර් හා 2015 පෙබරවාරි යන මාසවල කුරුණෑගල කාර්මික විද්‍යාලයේ සේවයේ නියුතු නිලධාරිනියන් දෙදෙනෙකු ස්ථාන මාරු වී ගොස් තිබුණද, තාවකාලික පදනම මත කාලය දීර්ඝ කරමින් කුරුණෑගල කාර්මික විද්‍යාලයේ රජයේ නිවාසවලම පදිංචි වී තිබුණි. අභ්‍යන්තර විගණන වාර්තාවෙන් සහ රජයේ නිවාස කමිටු වාර්තාවෙන්ද එම රජයේ නිවාස තව දුරටත් ඔවුන්ට ලබා නොදීමට නිර්දේශ කර තිබුණත්, ඊට පටහැනිව විගණිත දිනය වූ 2016 ජූලි 31 දින වන විටත්, රජයේ නිවාස නැවත භාරදී නොතිබුණි.

(vi) ගාල්ල, මහනුවර, බදුල්ල, බණ්ඩාරවෙල සහ හෝමාගම යන තාක්ෂණ විද්‍යාලවල වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් රජයේ නිවාසවල පදිංචි වී සිටි නිලධාරීන් 14 දෙනෙකුට එම රජයේ නිවාසවලින් ඉවත් වන ලෙස දන්වා ලිපි යවා තිබුණත්, එම නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 9.1 වගන්තිය පරිදි රජයේ නිවාසයක පදිංචිකරුවකු ඉවත් කිරීමට 1971 අංක 3 හා 1974 අංක 4 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 7 දරන රජයේ නිවාස ( සන්තකය ආපසු ලබා ගැනීම) පනතේ විධිවිධාන හා ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.1 වගන්තිය ප්‍රකාරව නිලධාරීන් නිවාසයෙන් ඉවත් කළ හැකි වුවත්, එසේ කර නොතිබුණි.

ඉහත සඳහන් නිරීක්ෂණ අනුව රජයේ නිවාස සඳහා ඉල්ලුම් පත් ලැබී තිබියදීත්, බදු කාලය අවසන්වීම, ස්ථාන මාරු වීම් ලැබීම, විශ්‍රාමයාම වැනි අවස්ථාවලදී හිස්වන රජයේ නිවාස පොරොත්තු ලේඛනයේ සිටින රජයේ නිලධාරීන් වෙත රජයේ නිවාස ලබා දීමට නොහැකි වී තිබුණි.

(ඊ) **පුස්තකාල පොත් පවත්වාගෙන යාම**

අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව සිසුන්, කාර්ය මණ්ඩලය හා බාහිර උපදේශකවරුන් විසින් පුස්තකාලයෙන් පොත් 795 ක් බැහැරව ගෙන ගොස් තිබුණු අතර එම පොත් 2015 දෙසැම්බර් 31 දින වන විටත් පුස්තකාලය වෙත නැවත භාර දී නොතිබුණි. එම පොත් නැවත ලබා ගැනීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

**3.7 බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් සඳහා පළාත් පාලන ආයතනවලින් ඉදිරිපත් කර තිබුණු බිල්පත්වලට අනුව ප්‍රධාන කාර්යාලයේ වරිපනම් අංක 03 ක් සඳහා 1996 වර්ෂයේ සිට රු.7,821,152 ක් හා තාක්ෂණ/කාර්මික විද්‍යාල 03ක 2013 වර්ෂයේ සිට රු.158,993 ක් වශයෙන් එකතුව රු.7,980,145 ක වරිපනම් ගෙවිය යුතුව තිබුණි.

**3.8 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මුදල් රෙගුලාසි 103(1) හා 104(1) | මරදාන හා වව්නියාව කාර්මික/තාක්ෂණ විද්‍යාලවල 2010 නොවැම්බර් 15 දින හා 2015 දෙසැම්බර් 22 දින සොරුන් ඇතුළු වී සිදු කර තිබුණු අලාභහානි හා දේපල සොරකම් කිරීමෙන් වූ අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 104(3) හා (4) | 2014 හා 2015 වර්ෂවල මරදාන, පොළොන්නරුව, රත්මලාන, බදුල්ල හා ත්‍රිකුණාමලය තාක්ෂණ/කාර්මික විද්‍යාලවල සිදු වූ පාඩු හා අලාභහානි සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ප්‍රමාද කර ඉදිරිපත් කර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 115 | ඉකුත් වර්ෂයේ ගෙවීම් සඳහා අධිකාරී බලය ලත් නිලධාරියෙකුගේ සහතිකය ලබා නොගෙන අවස්ථා 05 කදී එකතුව රු.1,680,696 ක ගෙවීම් කර තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 210(1) | පළාත් පාලන ආයතන සඳහා වරිපනම් බදු ගෙවීමේදී රු.127,620 ක වට්ටම් වාසිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (v) | මුදල් රෙගුලාසි 210(2) | අංක 1572/25 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව අවස්ථා 11 කදී නියමිත දිනට විදුලිය බිල්පත් නොගෙවීම හේතුවෙන් රු.30,867 ක දඩ මුදල් ගෙවා තිබුණි. |

**(ආ) භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ**

-----------------------------------

| | |
|---|---|
| 2015 නොවැම්බර් 23 දිනැති අංක 06/2015 දරන චක්‍රලේඛය | යාපනය තාක්ෂණ විද්‍යාලයේ සමාලෝචිත වර්ෂය අවසානයට තිබුණු රු.224,437 ක මුදල් ශේෂය මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

## 3.9 විදේශාධාර ව්‍යාපෘති

--------------------

### 3.9.1 ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය

-----------------------------------

දෙපාර්තමේන්තුව විසින් විදේශ මූල්‍යාණය යටතේ ක්‍රියාත්මක කර තිබුණු ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් කාර්මික හා තාක්ෂණික විද්‍යාලවල ගොඩනැගිලි නවීකරණය කිරීම, උපකරණ මිලදී ගැනීම හා පුහුණු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 225.61 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 147.14 ක් හෙවත් සියයට 65.22 ක් උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී නිම කිරීමට යෝජිතව තිබූ මාතර, කෑගල්ල හා මඩකලපුව කාර්මික විද්‍යාල ප්‍රතිසංස්කරණය හා නවීකරණය කිරීම සඳහා රු.මිලියන 103.66 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සැලැසුම් කළ පරිදි එම කටයුතු නිම කිරීම ප්‍රමාදවීම හේතුවෙන් ඒ සඳහා රු.මිලියන 55.94 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 53.96 ක් උපයෝජනය කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 40.00 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 38.56 ක් වැය කර ව්‍යාපෘතිය නිම කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව බණ්ඩාරවෙල, හෝමාගම හා සමන්තුරේ කාර්මික විද්‍යාලයන්හි ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු.මිලියන 90.00 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 46.86 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 52.07 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 43.14 හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 47.93 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට හා ප්‍රසම්පාදන සැලැස්මට අනුව බණ්ඩාරවෙල, හෝමාගම සහ සමන්තුරේ කාර්මික විද්‍යාලවලට උපකරණ මිලදී ගැනීම සඳහා රු. මිලියන 40 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 6.78 ක් හෙවත් සියයට 16.9 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව විදේශ රැකියා සඳහා ආධාර සපයන වැඩසටහනට රු.මිලියන 3 ක් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම අසාර්ථකවී තිබුණි.

(ඉ) ක්‍රියාකාරි සැලැස්මට අනුව මානව සම්පත් සංවර්ධනය (HRD) සඳහා නව අධ්‍යයන කාර්ය මණ්ඩලයක් (Effective Teaching Staff ) පත් කර ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමත කර ගත යුතු බව (PSC Approval ) සඳහන් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අදාළ අනුමැතිය ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මානව සම්පත් සංවර්ධනය සඳහා රු.මිලියන 5.76 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද, කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් උපදේශකවරුන් 16 දෙනෙකු සඳහා රු.මිලියන 5.67 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

**3.9.2 කාර්මික හා තාක්ෂණ විද්‍යාලවල මෝටර් යාන්ත්‍රික වැඩහල් නවීකරණය හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

-----------------------------------------------------------------------------------------------

තාක්ෂණ විද්‍යාල දෙකක හා කාර්මික විද්‍යාල තුනක මෝටර් යාන්ත්‍රික වැඩහල් නවීකරණය හා වැඩිදියුණු කිරීම සඳහා උපකරණ සැපයීම හා උපදේශකවරුන් පුහුණු කිරීම ඍජුවම කොරියානු ආධාර යටතේ සිදු කර තිබුණි. එම පාඨමාලා පැවැත්වෙන වැඩහල් හා පන්ති කාමර අළුත්වැඩියාව හා නවීකරණය ශ්‍රී ලංකා රජයේ අරමුදලින් සිදු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙම ව්‍යාපෘතිය සඳහා කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය විසින් ඇ.ඩො. මිලියන 03 ක් හා ශ්‍රී ලංකා රජයෙන් ඇ.ඩො. මිලියන 0.5ක් ඇස්තමේන්තු කර තිබුණි. එම ව්‍යාපෘති 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ නිම කිරීමට නියමිතව තිබුණි. 2013 වර්ෂය වන විට අදාළ වැඩහල්වල උපකරණ සවිකිරීමට අවශ්‍ය පරිදි නවීකරණය හා අළුත්වැඩියාව සිදු කර නොතිබීම නිසා 2015 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘති කටයුතු නිම කිරිමට අපොහොසත් වි තිබුණි. මීට අමතරව මෝටර් යාන්ත්‍රික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා මහනුවර තාක්ෂණ විද්‍යාලයේ සිසුන් 45 ක් තෝරා ගෙන තිබුණත්, මරදාන තාක්ෂණ විද්‍යාලයේ සිසුන් 24 ක් බඳවා ගෙන තිබුණි.

(ආ) මෝටර් යාන්ත්‍රික පුහුණුව සඳහා නවීනතම වර්ගයේ මෝටර් වාහන 05 ක් හා ව්‍යාපෘතියේ කටයුතු ධාවනය සඳහා එක් මෝටර් වාහනයක්ද කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය විසින් ඇ.ඩො. 98,994 කට අදාළ විද්‍යාල 05 කට හා ප්‍රධාන කාර්යාලයට ලබා දී තිබුණි. ඒ සඳහා රේගු බදු හා වෙනත් වියදම් වශයෙන් එකතුව රු.55,090,000 ක වියදම අදාළ අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි. 2016 අප්‍රේල් 30 දින වන විටත් එම වාහනවල අයිතියද අමාත්‍යාංශය වෙත පවරා ගෙන නොතිබුණි.

**3.10 කාර්යසාධනය**

------------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**(අ) තාක්ෂණ /කාර්මික විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම**

-----------------------------------------------------------------

2014 නොවැම්බර් 12 දිනැති අංක DTET/05/01/02(i)/2014 දරන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියෙන් 2015 වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමේ ඉලක්කය 2014 වර්ෂයේ බඳවාගත් සංඛ්‍යාවට වඩා අවම වශයෙන් සියයට 20 කින් ඉහළ නැංවීමට කටයුතු කළ යුතු බව දක්වා තිබුණි. දෙපාර්තමේන්තුවේ කළමනාකරණ තොරතුරු අංශය මගින් ඉදිරිපත් කරන ලද වාර්තාවලට අනුව 2014 වර්ෂයේ බඳවාගත් සිසුන් හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සිසුන් 3000 ක් හෙවත් සියයට 13 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී තාක්ෂණ/කාර්මික විද්‍යාල 09 ක සිසුන් සංඛ්‍යාව 326 කින් වැඩි වී තිබුණද, තාක්ෂණ/කාර්මික විද්‍යාල 30 ක සිසුන් 3,325 ක අඩුවීමක් වාර්තා විය. ප්‍රතිපත්තිමය තීරණයක් මත 2014 වර්ෂයේදී කෙටිකාලීන ඉංග්‍රීසි පාඨමාලා 2 ක් සීමිතව පැවැත්වීමටත්, සිසුන් හැකිතාක් දුරට දැතේ කර්මාන්ත හා සම්බන්ධ වෘත්තීය අධ්‍යාපනයට යොමු කිරීමට තීරණය කළ බවත්, ඒ අනුව ස්ථිර ඉංග්‍රීසි ආචාර්ය මණ්ඩලයක් සිටින ස්ථාන කිහිපයක පමණක් ඉංග්‍රීසි, පරිගණක, වාණිජ වැනි පාඨමාලා සඳහා සීමිත සිසුන් සංඛ්‍යාවක් පමණක් බඳවා ගෙන තිබුණු බවත්, විශේෂයෙන්ම දැතේ රැකියා ආශ්‍රිත වෘත්තීයමය පාඨමාලා සඳහා සිසුන් යොමුවීමේ ප්‍රවණතාවය ක්‍රමයෙන් සමාජයෙන් හීන වී යාමත් සිසුන් අඩුවීම කෙරෙහි සෘජුව බලපෑ බව දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විගණනයට දන්වා තිබුණි.

ඉහත සඳහන් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට අනුව බඳවාගත් සිසුන් ප්‍රමාණය 2014 වර්ෂයට වඩා 2015 වර්ෂයේදී සියයට 20 කින් ඉහළ නංවා ගැනීමට කාර්මික විද්‍යාල දෙකකට පමණක් හැකි වී තිබුණි. තාක්ෂණ/කාර්මික විද්‍යාල 29 ක 2014 වර්ෂයේ බඳවාගත් සිසුන් ප්‍රමාණය සමඟ සැසඳීමේදී 2015 වර්ෂයේදී සියයට 3 ක සිට සියයට 54 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් අඩු වී තිබුණි.

**(ආ) පාඨමාලා පැවැත්වීම**

----------------------

2014 ඔක්තෝබර් 03 දින හා 2014 දෙසැම්බර් 19 දින ගැසට් පත්‍ර මගින් ප්‍රසිද්ධ කරන ලද GSI ආකෘති පත්‍රය මගින් අනුමැතිය ලත් සිංහල, දෙමළ, ඉංග්‍රීසි, කොරියන් හා ජපන් භාෂා මාධ්‍යයෙන් පාඨමාලා ආරම්භ කිරීමට ඉලක්කගත කර තිබුණි. එම ඉලක්කගත පාඨමාලා තාක්ෂණ/කාර්මික විද්‍යාලවල පැවැත්වීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පාඨමාලා 150 ක් සඳහා දිවයින පුරා තාක්ෂණ/ කාර්මික විද්‍යාල 39 ක පංති 1,044 ක් සඳහා ළමුන් ඇතුළත් කර ගැනිමට ඉල්ලුම් පත් කැඳවා තිබුණි. සිසුන් බඳවා ගැනීමේ සංඛ්‍යා ලේඛන පරීක්ෂාවේදී ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද පාඨමාලා 103 ක් සඳහා පන්ති 663 ක් පමණක් ආරම්භ කර තිබුණි. ඒ අනුව ආරම්භ කිරීමට ඉලක්ක කරන ලද පාඨමාලාවලින්, පාඨමාලා 47 ක් හා පංති 381 ක් ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

(ii) 2014 නොවැම්බර් 12 දිනැති අංක DTET/05/01/02(i)/2014 දරන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් එක් එක් පාඨමාලාවලට අනුමත කර ඇති අවම සිසුන් සංඛ්‍යාව දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම අවම සිසුන් සංඛ්‍යාව නොමැතිව තාක්ෂණ/කාර්මික විද්‍යාලවල කර්මාන්ත ශාලා/විද්‍යාගාර පාදක පාඨමාලා 41 ක් සඳහා පංති 98 ක් හා පංති කාමර පාදක පාඨමාලා 12 ක් සඳහා පංති 62 ක් ආරම්භ කර තිබුණි. මෙම අවම සිසුන් සංඛ්‍යාවද නොමැතිව සිසුන් බඳවා ගෙන පාඨමාලා පැවැත්වීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා විසින් පහත සඳහන් හේතු ඉදිරිපත් කර තිබුණි.

- ස්ථිර උපදේශකවරු සිටීම හේතුවෙන් සිසුන් අවම සංඛ්‍යාවක් සහිතව ඇතැම් පාඨමාලා පවත්වා ගැනීමට සිදුවීම

- සිසුන්ගේ ඉල්ලුම ඉතා මඳ වුවද, ලී වැඩ, මේසන් වැඩ, වැල්ඩින් වැඩ ආදී වෘත්තීන්ට අදාළව පාඨමාලා සඳහා බොහෝ විද්‍යාලවල විශාල යන්ත්‍ර

උපකරණ සහිත වැඩහල් පැවැතීම හා ඒවා අඛන්ඩව ඉදිරියට පවත්වා ගෙනයාමේ දැඩි අවශ්‍යතාවය මත සිසුන් අවම ප්‍රමාණයකින් ආරම්භ කිරීම.

- යන්ත්‍ර උපකරණ සහිත වැඩහලක් එක වර්ෂයකදී සිසුන් නොමැතිව වසා දැමීමට සිදු වුවහොත්, නැවත පරිහරණයට ගත නොහැකි අයුරින් දිරාපත් වීම, ක්ෂයවීම සිදුවන නිසා අවම සිසුන් සංඛ්‍යාවකින් හෝ පවත්වා ගෙන යාමට සිදු වීම.

- යම් වර්ෂයක යම් වැඩහලක් සහිත පාඨමාලාවක් වැසී ගිය හොත් ඉදිරි වර්ෂවල සිසුන් එම පාඨමාලාවට නොපැමිණීම සිදුවන නිසා අවම සිසුන් සංඛ්‍යාවකින් හෝ පවත්වා ගැනීමට සිදු වීම.

- අවම සිසුන් සංඛ්‍යාවකින් හෝ ආරම්භ කර පාඨමාලා පවත්වා ගෙන යාමෙන් ඉදිරි වර්ෂවල සිසුන් පැමිණීමට ඇති පෙළඹවීම මත පවත්වා ගෙන යාමට කටයුතු කිරීම.

**(ඈ) විභාග ප්‍රතිඵල**

---------------

දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන තොරතුරු අංශයෙන් ලබාගත් තොරතුරුවලට අනුව පසුගිය වර්ෂයේ පවත්වන ලද පාඨමාලා 38 ක විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පාඨමාලා 38 ක් සඳහා බඳවාගෙන තිබුණු සිසුන් 16,220 කින් සිසුන් 10,637ක් විභාගයට පෙනී සිට තිබුණත්, සිසුන් 6,307 ක් පමණක් විභාගය සමත්වී තිබුණි. සිසුන් 3,025 ක් ඌන සාමාර්ථ ලබා ගෙන තිබුණි. මේ අනුව බඳවාගත් සිසුන් සංඛ්‍යාව හා සැසඳීමේදී සමත් සංඛ්‍යාව සියයට 39 ක් වූ අතර ඌන සමත් සිසුන් සංඛ්‍යාව සියයට 19 ක් විය.

(ii) 2014 වර්ෂයේදී පවත්වන ලද ඩිප්ලොමා පාඨමාලා සම්බන්ධයෙන් වූ විභාග ප්‍රතිඵල විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2014 ජනවාරි 28 දිනැති අංක TVET/1/ච.ලේ/2004/1 දරන කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ චක්‍රලේඛය ප්‍රකාරව පාඨමාලාවක ප්‍රතිලාභ ලබා ගත යුතු සංඛ්‍යාව පාඨමාලාව අවසන් වන විට සියයට 70 කට නොඅඩු විය යුතු බව අවධාරණය කර තිබුණත්, එම ඉලක්කය වෙත ළඟාවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(iv) පසුගිය වර්ෂයේ පවත්වන ලද පාඨමාලා සඳහා වූ විභාගවලින් තාක්ෂණ /කාර්මික විද්‍යාල 29 ක පාඨමාලා 16 කට පෙනී සිටි සියළුම සිසුන් අසමත්වී තිබුණු අතර එම සිසුන් ප්‍රමාණය 485 ක් විය. ඉන් සිසුන් 149ක් NCECP - Gas and arc welder පාඨමාලාවෙන්ද සිසුන් 84 ක් NC in Technology (Civil) පාඨමාලාද හදාරා තිබුණි.

**(ඇ) සිසුන් පාඨමාලා හැරයාම**

**--------------------------**

විගණනය වෙත ලබා දී තිබුණු තොරතුරුවලට අනුව පාඨමාලා 38 ක් සඳහා බඳවාගෙන තිබුණු සිසුන් 16,220 කින් සිසුන් 10,637ක් විභාගයට ඉදිරිපත් වී තිබුණි. ඉන් සිසුන් 5,583 ක් හෙවත් සියයට 34ක ප්‍රමාණයක් පාඨමාලා හැර ගොස් තිබුණු බව නිරීක්ෂණය විය. මීට සාපේක්ෂව 2013 වර්ෂයේ සිසුන්ගෙන් සියයට 33 ක් පාඨමාලා හැර ගොස් තිබුණි. ඉතිරි පාඨමාලාවලින් සිසුන් හැරයාම සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඉ) පාඨමාලා ප්‍රතීතනය**

**--------------------**

2013 පෙබරවාරි 26 දිනැති අංක 01 /2013 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වෘත්තීය සුදුසුකම් චක්‍රලේඛ අනුව සියළුම පාඨමාලා ප්‍රතීතනය කළ යුතු වුවද, විගණිත දිනයවූ 2016 අගෝස්තු 01 දිනට තාක්ෂණ /කාර්මික විද්‍යාල 39 හි පවත්වාගෙන යනු ලබන පාඨමාලා 670 කින් පාඨමාලා 200 ක් ප්‍රතීතනය කර නොතිබුණි. මේ හේතුවෙන් ජාතික මට්ටමේ සහතිකයක් ලබාගැනීමේ අවස්ථාව අහිමිවී ඇති බව විගණණයේදී නිරීක්ෂණය විය.

**3.11 අවිධිමත් ගනුදෙනු**

**-------------------**

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියකින් තොරව 2015 අගෝස්තු 17 දින පවත්වන ලද මහ මැතිවරණ කටයුතු සඳහා මොණරාගල කාර්මික විද්‍යාලයේ මෝටර් රථයක් 2015 ජූලි 23 දින සිට 2015 අගෝස්තු 30 දින දක්වා කි.මී. 3807 ක් හා ඉන්ධන ලීටර් 421.6 යොදා ගෙන තිබුණු බව ධාවන සටහන් පරික්ෂාවේදි නිරීක්ෂණය විය.

**3.12 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

**-------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව සඳහා රූපවාහිනී යන්ත්‍රයක්, ජංගම දුරකථනයක් හා tablet pc එකක්, එකතුව රු.365,784 කට 2015 දෙසැම්බර් 14 දින මිලදී ගෙන තිබුණි. මෙම මිලදී ගැනීම් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව සිදු කර නොතිබුණි. මිලදී ගෙන තිබුණු tablet pc උපකරණය විගණිත දිනය වූ 2016 මැයි 31 දින වන විටත් අදාළ අරමුණු සඳහා යොදවා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.365,784 ක් වැය කර තිබුණි. අදාළ ලිපිගොනු පරීක්ෂාවේදී එම ගෘහ භාණ්ඩ සඳහා පිරිවිතර සකස්කර නොතිබුණු අතර තාක්ෂණ ඇගයීම් කමිටුවේ හෝ ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ ලබා නොගෙන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව සිදු කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ගබඩාවට ලැබී තිබුණු කාර්ය මණ්ඩල පුටු 07 ක් හා සම්මන්ත්‍රණ පුටු 30 ක් පිළිවෙලින් රු. 47,250 කට හා රු.178,500 කට මිලදී ගෙන තිබුණි. එම පුටු අදාළ පිරිවිතරයන්ට අනුකූලව සපයා නොතිබුණද ඒ සඳහා සැපයුම්කරුට මුදල් ගෙවා තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශය ප්‍රකාරව මරදාන තාක්ෂණ විද්‍යාලයේ ස්වයං චලන වැඩහල අළුත්වැඩියා කිරීම සඳහා පිළියෙල කර තිබුණු මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.4,914,215 ක් වී තිබුණි. ඇස්තමේන්තුවට ඇතුළත් වැඩ විෂයයන් 20 ක් සඳහා රු.1,042,597 ක් හා මුලික ඇස්තමේන්තුවට ඇතුළත් නොවූ වැඩ විෂයයන් 27 ක් සඳහා ඇස්තමේන්තු ගත වටිනාකම ඉක්මවා රු.989,240 ක් වශයෙන් එකතුව රු.2,031,837 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 313 | 685 | 754 | 126 |
| (ii) | තෘතියික මට්ටම | 144 | 24 | 120 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,272 | 849 | 426 | 03 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,167 | 1,014 | 182 | 29 |
| | **එකතුව** | **3,896** | **2,572** | **1,482** | **158** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අතිරික්ත සේවක සංඛ්‍යාව 158 ක් වුවද, ඉන් 124 ක් 2016 පෙබරවාරි 28 දින වන විට තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල පුරප්පාඩුවලට අනුයුක්ත කර තිබුණි. අනුමත කාර්ය මණ්ඩලයට අනුව සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරු 1ක් පැවතියද, එම තනතුර හිමි නිලධාරිනිය 2015 ජනවාරි 05 දින සිට වසර 5 ක කාලයකට විදේශ ගත වීම හේතුවෙන් එම තනතුරට වෙනත් නිලධාරිනියක් පත් කර තිබුණි. මීට අමතරව ද්විතීය මට්ටමේ හා ප්‍රාථමික මට්ටමේ අතිරික්ත කාර්ය මණ්ඩලය 32 ක් අනුමත නොවූ තනතුරුවලට පත් කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල කථිකාචාර්යවරු 211 ක් හා උපදේශකවරු 310 ක් පුරප්පාඩුව පැවති අතර ඒ සඳහා බාහිර උපදේශකවරු බඳවාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත තොරතුරු නිරීක්ෂණය විය.

- දෙපාර්තමේන්තුව යටතේ පවතින තාක්ෂණ/කාර්මික විද්‍යාලවල අදාළ නියමිත විෂයයන් සඳහා බාහිර දේශකයින් බඳවා ගැනීම එම විද්‍යාලයේ අධ්‍යක්ෂ/විදුහල්පති විසින් සිදු කර තිබුණි. එම දේශකවරුන් සඳහා ගෙවීම් කිරීම සඳහා ප්‍රතිපාදන ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගන්නා බවත් එම ගෙවීම් අධ්‍යාපන සුදුසුකම් මත කරනු ලබන බැවින් ගණනය කරන ලද දේශක ගෙවීම්වල නිවැරදිතාවය පිළිබඳ පරීක්ෂාවක් ප්‍රධාන කාර්යාලය විසින් සිදු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

- තාක්ෂණ/කාර්මික විද්‍යාලයේ විදුහල්පති/අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි බාහිර දේශකයින් බඳවාගැනීම සිදුවන බැවින් එම විද්‍යාල විසින් බඳවාගත් දේශකයින්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් හා දේශන පැවැත්වීමේදී පවතින කාර්යක්ෂම බව හා ඵලදායීතාව පිළිබඳව ඇගයීමක්ද සිදු නොවන බව නිරීක්ෂණය විය. අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව සමහර බාහිර දේශකයින් බඳවාගැනීමේ සුදුසුකම්වලට අදාළ සහතික පත් සත්‍ය පිටපත් බව අදාළ ආයතනවලින් තහවුරු කර ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ ගොඩනැගිලි වෘත්තිය පිළිබඳ උපදේශක තනතුරකට 1987 දෙසැම්බර් 01 දින සිට සේවයට පත්කර තිබුණු නිලධාරියකුගේ සේවය ස්ථිර කිරීමද, උසස් කිරීමද හා වැටුප් වර්ධක ලබාදීම යන අවස්ථාවලදී සිදුව ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට 2016 සැප්තැම්බර් මාසය වන විටත් දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන නොතිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ 3:8:2 වගන්තිය ප්‍රකාරව ඒ ඒ ගණයට අයත් කාර්ය ස්ථානයක සේවය කළ යුතු උපරිම කාලපරිච්ඡේදය අනුව ස්ථාන මාරුවීම් ලබා දිය යුතු වුවත්, අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට තාක්ෂණ/කාර්මික විද්‍යාල 07 ක අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 18 ක්ද, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 40 ක්ද, වසර 10 කට වඩා වැඩි කාලයක් එකම ස්ථානයේ සේවය කර තිබුණි.